## අයගම ප්‍රාදේශීය සභාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 පෙබරවාරි 27 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 පෙබරවාරි 22 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 ජූනි 20 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව අයගම ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, සභාපතිවරයාට යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට අයගම ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබූ රු. 4,240,917 ක් වූ ඇප තැන්පත්, රු. 2,787,920 ක් ලෙසද සමාලෝචිත වර්ෂය තුළදී නිදහස් කරන ලද රු. 2,405,454 ක් වූ ඇප තැන්පත් රු. 3,197,319 ක් ලෙසද ගිණුම්ගත කර තිබූ බැවින් තැන්පත් ගිණුමේ ශේෂය රු. 2,244,862 ක් අඩුවෙන් දක්වා තිබුණි.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,402,258 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 226,099 ක් විය.

2.2 මූල්‍ය පාලනය

ගිණුම් විෂයයන් 10 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු. 13,209,406 ක් වූ අතර, උපයෝගි ලේඛන අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 6,178,259 ක් විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු. 000' | රු. 000' |
| (i) වරිපනම් හා බදු | 188 | 164 | 106 |
| (ii) බදු කුලී | 1,286 | 1,288 | - |
| (iii) බලපත්‍ර ගාස්තු | 262 | 270 | 5 |
| (iv) වෙනත් ආදායම් | 6,129 | 16,676 | (6,404) |

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| (i) උසාවි දඩ | 2,450,584 |
| (ii) මුද්දර ගාස්තු | 544,986 |

2.4 අවිධිමත් ගනුදෙනු

සමාලෝචිත වර්ෂය තුලදී මිළ ගණන් කැඳවීමක් නොමැතිව රු. 43,750 ක වටිනාකමින් යුත් කාර්යාල උපකරණ මිලදී ගෙන තිබුණි. මිළදී ගෙන තිබූ උපකරණ බිල්පතෙහි සඳහන් උපකරණ විස්තර සමඟ නොසැසඳුනි.

2.5 කොන්ත්‍රාත් පරිපාලනය

අයගම රාහුල මධ්‍ය මහා විද්‍යාලීය ක්‍රීඩා පිටිය කෙළවර පැති බැම්මේ කොටසක් ඉදි කිරීමේ කර්මාන්තයේ ඇස්තමේන්තුවේ වැඩ විෂයය අංක 05 සඳහා බැම්මේ දිග අඩි 75 ක් වෙනුවෙන් රු. 217,400 ක් ගෙවා තිබුණද 2011 දෙසැම්බර් 06 දින කරන ලද භෞතික පරික්ෂාවේදී බැම්මේ දිග අඩි 71 ක් වූයෙන් රු. 17,363 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.

2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව රු. 756,697 ක් වූ ඉකුත් වූ තැන්පතු නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයන්හි ලැබී තිබූ රු.96,640 ක වටිනාකමට වූ භාණ්ඩ, තොග ලේඛණයක සටහන් කර නොතිබුණි.

(ඇ) 2011 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම හිඟහට සේවක ණය අත්තිකාරම් ගිණුම් ශේෂ වල එකතුව රු. 61,045 ක් වූ අතර ලැබිය යුතු ගිණුම් ශේෂ වල එකතුව රු. 89,500 ක් විය.

(ඈ) වාර්ෂික කාර්ය සාධන වාර්තා පිළියෙල කර නොතිබුණි.

2.7 අරමුදල් ඌන උපයෝජනය

වැය විෂයයන් 37 කට අදාලව සමාලෝචිත වර්ෂයේ සළසා ගෙන තිබූ එකතුව රු. 427,000 ක් වූ ප්‍රතිපාදන වලින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) අයවැය පාලනය